# හෙළටුවාවන්ගේ සම්භවය හා අවසානය

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

**අලුත්ගම ධම්මිස්සර හිමි**

"බුද්ධවචනස්ස අත්ථසංවණ්ණනාභූතො කථාමග්ගො සොයෙව මහාමහින්දත්ථෙරෙන තම්බපණ්ණිදීපං ආභතො පච්ඡා තම්බපණ්ණියෙහි මහාථෙරෙහි නිකායන්තරලද්ධිසංකර පරිහාරත්ථං සීහල භාසාය ඨපිතො."[1]

මිහිඳු මහරහතුන්වහන්සේ ඇතුළු පිරිස වාචනාමාර්ගයෙන් ගෙනා පෙළ අටුවා ලාංකික භික්ෂූන් හෙළබසින් උගත් බව සඳහන් වේ. " ධම්මං භාසිත්වා දීපභාසාය එවං "[2] යන මහාවංශ කියමනට අනුව මිහිඳු මාහිමියෝ දීපභාෂාවෙන් දහම් දෙසීම කළහ. මේ කාලය වන විට සිංහල භාෂාව ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන් දියුණු තත්ත්වයක පැවැති බව පෙනේ. බුදුවසින් 236 වැන්නෙහි ලක්දිවට පැමිණි මිහිඳු හිමියන් දෙසූ චුල්ලහත්ථිපදෝපම සූත්‍රය, ධම්මචක්ක සූත්‍රය, සච්ච සංයුත්ත වැනි ගැඹුරු සූත්‍ර දේශනාවන් පවා නිරවුල්ව මෙරට වැසියන් අවබෝධ කර ගැනීමට සමත්වූවා නම් සිංහල යෙහි භාෂාව දියුණුව පැවැති බව මහාචාර්ය කොටහේනේ පඤ්ඤාකිත්ති හිමිපාණන්ගේ මතයයි.[3]

සිංහලයෙහි අතිපැරණි සාහිත්‍ය කෘති ලෙස හෙළටුවා දැක්විය හැකිය. මිහිඳු මාහිමියන් ඇතුළු පිරිස මෙරටට ගෙනෙන ලද ත්‍රිපිටක ධර්මය සඳහා සිංහලයෙන් ලියන ලද අටුවා ' හෙළටුවා ' යනුවෙන් සඳහන් කළ හැකිය. මෙරට සාහිත්‍ය ඉතිහාසයේ මෙම හෙළටුවා වළගම්බාරාජ්‍ය සමයේ ලේඛනාරූඪ කිරීම ඓතිහාසික සිද්ධියකි.[4] ක්‍රි.ව. 5 සියවසේ දී ලක්දිව මහාවිහාරයට වැඩම කළ බුද්ධඝොෂ, බුද්ධදත්ත ආදි අටුවාචාරීන් විසින් මෙම හෙළටුවා මාගධී භාෂාවට පෙරළන ලදහ. ඒ බව බුද්ධඝොෂ අටුවාචාර්යයෝ හැම නිකායට්ඨකථාවකම ප්‍රස්තාවනාවෙහි දක්වූහ. බුද්ධඝොෂ හිමියෝ සිය අටුවා කරණය සඳහා මූලික වශයෙන් හෙළටුවා තුනක් උපයෝගී කර ගත්හ.

" මහා අට්ඨකථඤ්චෙව — මහාපච්චරියමෙව ච
කුරුන්දිඤ්චාති තිස්සොපි — සීහළට්ඨකථා ඉමා."[5]

(1) මහා අට්ඨකථා හෙවත් මූලට්ඨකථා, (2) මහාපච්චරියට්ඨකථා, (3) කුරුන්දි අට්ඨකථා යන ග්‍රන්ථත්‍රය සීහළ භාෂාවෙන් රචිත යැයි බුදුගොස් තෙරණුවෝ දැක්වූහ. පොළොන්නරු යුගයෙහි රචිත බොධිවංස ග්‍රන්ථිපද විවරණයෙහි ද " මිහිඳු මහතෙරුන් මෙරටට වැඩි කල තත්කාලවර්තීනට අවගමවනු සඳහා සිංහල භාෂාවෙන් තිබූ අටුවාත්‍රයෙහි. . . . " යන්නෙන් මේ පුවතම සවිස්තරව දැක්වේ.[6]

මෙම අටුවාත්‍රය අද අප අතර දක්නට නැතත් මෙම ග්‍රන්ථ සමුදයේ තත්ත්වය ගැන කරුණු විමසීම වැදගත් යුතුකමකි. මෙම හෙළටුවා පාළියට නැගීමේදී ඒවාහි ඇතුළත් වැරදි තැන් නිවැරදි කිරීම සඳහා බුද්ධඝොෂ මාහිමියන්ට විශාල කාලයක් මිඩංගු කිරීමට සිදුවූ බව සඳහන් වෙයි.[7] සිංහල අටුවා තුළ නොමැති කරුණු පිළිබඳව බුදුගොස් හිමියෝ " අයං අත්තනො මති "[8] යනුවෙන් සියමතය දැක්වීමට අමතක නො කළහ. මෙසේ හෙළටුවා පාළියට නැගීම නිසා එක් අතකින් සිංහලය පරිහානියට ගිය අතර පාලි භාෂාව පෝෂණයවීමට හේතුවූ බවද කිවයුතුය. හෙළටුවා අද අප අතර දක්නට නැතත් එකල හෙළබස ඉතා උසස් මට්ටමක තිබුණුබව වංශකථා, සෙල්ලිපි, හෙළටුවා පාඨ ආදියෙන් මනාව පැහැදිලි වේ.

---

1. සාරත්ථ දීපනී (16 පිට).
2. මහාවංශය XIV 65 ගාථාව.
3. සාහිත්‍ය කථා (2 පිට).
4. මහාවංශය.
5. සමන්තපාසාදිකාව — හේවාවිතාරණ මුද්‍රණය (1056 පිට).
6. බොධිවංස ග්‍රන්ථිපද විවරණය (133 පිටුව).
7. රසවාහිනී වෙසක් කලඹ — 1980 මැයි (පිටුව 72).
8. පපංචසූදනී.

**(1) මූලට්ඨකථා හෙවත් මහාඅට්ඨකථා**

තෙවැදෑරුම් හෙළටුවා අතර ඉතා මහත්වූත් ඉතා පැරණිවූත් අටුවාව ලෙස ගැණෙන්නේ මූලට්ඨකථාවයි. අනිත් අටුවාවන්ට වඩා හැම අතකින්ම උසස් වූ නිසා එය ' මහාඅට්ඨකථා ' නමින් ද හඳුන්වන්නට ඇත. මහාවිහාර පරම්පරාවට අයත් මේ අටුවාව අද දක්නට නැතත්, එහි සඳහන් ඇතැම් වැකි දම්පියා අටුවා ගැටපද සන්නයේ සඳහන් වේ. එහි දැක්වෙන එම වැකි අනුව හෙළටුවාවල භාෂා තත්ත්වය කෙබඳු අයුරකින් පැවතියා දැ'යි සිතිය හැකිය. එහි භාෂාව පැරණි සෙල්ලිපි බස හා බොහෝදුරට සමාන බව කියවේ.[9]

(i) යොගෙ සොහෙ වදන කී උපද්දව හිඳිම් (ධ. අ. ගැ. 79)

(ii) හෙළටුවායෙහි වෙරියෙක් විද මැරීය යෙක් (ධ. අ. ගැ. 80)

(iii) ලකුණ්ටකො වදනකී රස්ස නැම් යනු හෙළටුවා (ධ. අ. ගැ. 148)

(iv) සාළිත්ථක සිප්පෙ, පයක් හකුරුලන සිප්හි, හෙළටුවායෙහි '' සා[ලි]න් තහක් කරන ලනක සිපැයියෙත් (ධ. අ. ගැ. 136)

(v) රහදෙවදනකී ද ආචාටහිනම් හෙළටුවායෙහි (ධ. අ. ගැ. 149)

(vi) හෙළටුවායෙහි සනහන මට්ඨකයෙක් (ධ. අ. ගැ. 121)

(vii) සාමාවතියා වත්ථුනාම පයමං යි — මහඅටුවාහි ආ බැවින් (ධ. අ. ගැ. 80)

**(2) මහාපච්චරියට්ඨකථා**

සීහලට්ඨකථා අතර දෙවෙනි තැන ලැබෙන්නේ මෙයටයි. '' මහාපච්චරියන්ති එත්ථ උළුම්පං වුච්චති, තස්මිං නිසීදිත්වා කතත්තා තමෙව ජාතං නාම '' මහා පසුරක් මත සිට ලියන ලද හෙයින් මෙනමින් පතළ වී ඇති බව සඳහන් වේ.[10] ආචාර්ය පුංචිබණ්ඩාර සන්නස්ගල ශූරීන්ගේ මතය වළගම්බා කාලයේ දී ඇති වූ බැමිණිතියා මහාසාය සමයේ දී මෙය කළ බවයි.[11] විනය අටුවාවේ මේ ගැන සඳහන් වෙන තැන් සුලබව දක්නට ඇත. අනිත් කිසිම අටුවාවක් මෙතරම් වාර ගණනක් විනය අටුවාවේ සඳහන් නොවේ. 90 වරකටත් වඩා මහාපච්චරි නාමය එහි සඳහන් වන හෙයිනි.[12]

**(3) කුරුන්දි අට්ඨකථාව**

'' කුරුන්දිවෙල්ලිවිහාරො නාම අත්ථි, තත්ථ කතත්තා කුරුන්දීති නාමං ජාතන්ති වදන්ති.'[13]

'' කුරුන්දට්ඨකථා නාම කුරුන්දවෙලු විහාරො අත්ථි තස්මිං නිසීදිත්වා කතත්තා කුරුන්දි නාම ජාතා අට්ඨකථා.' [14]

සාරත්ථදීපනී හා විමතිවිනොදනී යන ග්‍රන්ථද්වයේ කියවෙන ' කුරුන්දිවෙල්ලි ' විහාරයේ දී කුරුන්දි අට්ඨකථාව කරන ලද බව පෙනේ. මෙය හෙළටුවාවල අවසාන කෘතිය ලෙස සැලකේ.

මේ අනුව බලනවිට ලක්දිව හෙළටුවා ග්‍රන්ථ රාශියක් තිබුණ අතර ඒවාහි දැනට සමහර වැකි හැරෙන්නට එම ග්‍රන්ථ දක්නට නැත. පාළි අටුවා කිරීමට මෙම හෙළටුවා මුල් වූ බවත්, මෙම ග්‍රන්ථ සමූහය කෙතෙක් තිබුණා දැයි නිශ්චය වශයෙන් කිව නොහැකි බවත් දැක්වෙයි.[15] අනුරපුර යුගයේ ලියවුණ දම්පියා අටුවා ගැටපදයේ හෙළටුවාවලින් උපුටා ගත් පාඨ දක්නට ලැබේ. දඹදෙණි සමයේ ලියවුණ '' විසුද්ධිමාර්ග සන්න '' යෙහි ද හෙළටුවා මත සනාථ වී ඇති බව පෙනේ. මේ නිසා 13 සියවස තෙක් හෙළටුවා පැවැති බව සමහරු නිගමනය කරති.[16] විනයාලංකාරයෙහි සඳහන් අන්දමට

---

9. සිංහල සාහිත්‍යවංශය — පුංචිබණ්ඩාර සන්නස්ගල (47 පිට).
10. සාරත්ථදීපනී (17 පිට).
11. සිංහල සාහිත්‍යවංශය (47 පිට).
12. ශාසනවංශ ප්‍රදීපය — මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි (67 පිට).
13. සාරත්ථදීපනී (17 පිට).
14. විමතිවිනොදනී (5 පිට).
15. සිංහල සාහිත්‍යය ආචාර්ය ආනන්ද කුලසූරිය (1959 — 46 පිට).
16. අනුරාධපුර යුගය — ලියනගමගේ ගුණවර්ධන (1961 — 100 පිට).

මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට ගෙනාවේ මූලට්ඨකථාව යැයි සඳහන් වෙතත් බුද්ධඝොස් හිමියන් පාළි අටුවා කිරීමේ දී මේ අටුවාත්‍රයම උපයෝගී කරගෙන ඇත. පාළි ඉතිහාස ග්‍රන්ථයක් වූ ' සද්ධර්ම සංග්‍රහ ' යෙහි කියවෙන පරිදි සිංහල අටුවාත්‍රය ත්‍රිපිටකයට වෙන වෙනම ලියූ අටුවා බව පෙනේ. නමුත් එම අදහස් අපැහැදිලි වන්නේ පසුරු හා කුරුන්දි අටුවා විනය අටුවා ලෙස සලකන බව සමන්ත පාසාදිකා අටුවාවෙන් පැහැදිලි වන නිසාය. බොහෝ උගතුන්ගේ පිළිගැනීම නම් ත්‍රිපිටකයටම ලියන ලද අටුවාව මහාඅටුවාව බවයි. මේ අනුව අටුවාත්‍රය ගැන විවිධ මත දක්නා ලැබේ.

හෙළටුවා පාඨ පිළිබඳ ශ්‍රේෂ්ඨ පර්යේෂණයක් යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමිපාණෝ කළහ. පැරණි හෙළ බසට සරිලනසේ සකස් කොට ඇති කොටස් මැදුම් සඟියට ලියන ලද සමන්තෝසනාවෙහි ඇතුළත්ව ඇත.

අස්සුතවන්ත පුථුජ්ජනහ වසෙනි පඨමක භූමි පරිච්ඡේදි (ම. නි. පිට 10)
සෙඛහ විවට්ට වසෙනි දුතියක භූමි පරිච්ඡේදි (ම. නි. පිට 12)
ඛීණාසවහ පඨමකනයෙ තතියක භූමි පරිච්ඡේදි (ම. නි. පිට 12)
ඛීණාසවහ දුතියකනයෙ චතරවනක භූමි පරිච්ඡේදි (ම. නි. පිට 14)
ඛීණාසවහ තතියකනයෙ පඤ්චවනක භූමි පරිච්ඡේදි (ම. නි. පිට 14)
ඛීණාසවහ චතුත්ථකනයෙ ඡවනක භූමි පරිච්ඡේදි (ම. නි. පිට 16)
සත්ථාරහ පඨමකනයෙ සත්තවනක භූමි පරිච්ඡේදි (ම. නි. පිට 16)
සත්ථාරහ දුතියකනයෙ අට්ඨවනක භූමි පරිච්ඡේදි (ම. නි. පිට 18)

මේ වැකි සියල්ල පැරණි හෙළටුවා බසට මෙන්ම පැරණි සෙල්ලිපි බසට ද සමානය. " . . . . . . කඩු බළගමකෙහි වසනක අමෙත් පහෙජ සිවය " යන තෝනිගල සෙල්ලිපියේ බසින් ඒ බව පැහැදිලි වේ. මේ අනුව හෙළටුවාවල භාෂා තත්ත්වය කෙබඳුදැයි නිගමනය කළ හැකිය.

---

ධ. අ. ගැ. — ධම්පියා අටුවා ගැටපදය.
ම. නි. — මජ්ඣිම නිකාය (බුද්ධ ජයන්ති මුද්‍රණය).